# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය
த. பெ.இ
Po.Box No — 10120

ෆැක්ස්
தொலைநகல
Fax — 011-2171635

දුරකථන
தொலைபேசி
Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය
இணையதளம்
Web Site — www.Police.lk

ඊ මේල්
மின்னஞ்சல்
E-mail — dir.media@police.gov.lk


මගේ අංකය
எனது இலக்கம்
My NO — 1576 /2023

ඔබේ අංකය
உமது இலக்கம்
Your No — / 2023

දිනය
திகதி
Date — 15/12/2023 පැය 1045

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2023.12.14 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 02 | 01 | 43.75 | 900 | යකඩ බැරල් 05ක් යතුරු පැදි 01 ක් |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් සහ දේපල අදාළ පොලිසියට ඉදිරිපත් කර ඇත.

**02. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකය.**

2023.12.14 වන දින දහවල් කාලයේ හළාවත පොලිස් වසමේ ගුරුමිදැත්ත, කුමාරකට්ටුව ප්‍රදේශයේදී පොලිස් විශේෂ කාර්ය බලකා සංවිධානාත්මක අපරාධ මර්ධන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **කේරළ ගංජා කිලෝ 01, ග්‍රෑම් 650 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන හළාවත පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන කුමාරකට්ටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. හළාවත පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සහ මන්නා පිහි සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මුලස්ථාන විශේෂ වැටලීම් ඒකකය.**

2023.12.14 වන දින උදෑසන කාලයේ අම්බලන්ගොඩ පොලිස් වසමේ ගලගොඩවත්ත ප්‍රදේශයේ පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන විශේෂ විමර්ෂන ඒකකයේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 11, මිලි ග්‍රෑම් 590ක් සහ මන්නා පිහි 02ක් සන්තකයේ තබා ගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන අම්බලන්ගොඩ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන ගලගොඩවත්ත ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වන අතර මෙම සැකකරු සංවිධානාත්මක අපරාධකරුවකුගේ සමීපතමයෙකු බවට අනාවරණය වී ඇත. අම්බලන්ගොඩ පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 04. ගෝන මස් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුර.

2023.12.14 වන දින දහවල් කාලයේ වැල්ලවාය පොලිස් වසමේ තිස්සපාර, වැල්ලවය ප්‍රදේශයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **ගෝන මස් කිලෝ 12 ක් සමඟ සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වන සත්ව අඩවි ආරක්ෂක කාර්යාලය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 58 ක් වන දෙයියන්නේවෙල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.

## 05. බලපත්‍ර නොමැතිව වැලි කැණීම් කරමින් සිටි සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා සමන්තුරේ කඳවුර.

2023.12.14 වන දින දහවල් කාලයේ සමන්තුරේ පොලිස් වසමේ මජීඩ්පුර ප්‍රදේශයේ ආලවට්ටාන් පාලම අසල ඇල මාර්ගයේ පොලිස් විශේෂ කාර්ය බලකා බුත්තල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු කර **බලපත්‍ර නොමැතිව නිති විරෝධී අන්දමින් වැලි කැණීම් කර ලොරි රථයකට පටවමින් සිටි පුද්ගලයකු ලොරි රථයක් සමඟ** අත්අඩංගුවට ගෙන සමන්තුරය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන සමන්තුරය ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. සමන්තුරය පොලීසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

## 06. විදෙස් රටක නිෂ්පාදිත ගිනි අවියක් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර

2023.12.14 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත ඇහැලියගොඩ පොලිස් වසමේ ඇහැලිගොඩ ප්‍රදේශයේ වැටලීමක් සිදු කර **විදේශ රටක නිෂ්පාදිත ගිනි අවියක් සහ පතරොම් 02 ක් සන්තකයේ තබා ගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන ඇහැලියගොඩ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 45 ක් වන ඇහැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකි. ඇහැලියගොඩ පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. අනවසරයෙන් පතල් කැණීම් සිදු කරමින් සිටි සැකකරුවන් 08 දෙනෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුර.

2023.12.14 වන දින සවස් කාලයේ ඇන්දාන පොලිස් වසමේ රක්වාන ගඟ ප්‍රදේශයේ පොලිස් විශේෂ කාර්ය බලකා කහවත්ත කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැටලීමක් සිදු **බලපත්‍ර නොමැතිව පතල් කැණීම් සිදු කරමින් සිටි පුද්ගලයින් 08 දෙනෙකු එම කැණීම් කටයුතු සඳහා උපයෝගී කරගන්නා උපකරණද සමගින්** අත්අඩංගුවට ගෙන ඇහැලියගොඩ මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය වෙත භාර දී ඇත.

අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 29 සහ 53 අතර වයස් වල පසුවන කහවත්ත, අටකලන්පන්න හා ගොඩකවෙල ප්‍රදේශ වල පදිංචිකරුවන් වේ.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**